## භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය - 2016

-----------------------------------------------------

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් රු.108,272,097 ක්වූ කාර්යාංශයට අනුබද්ධිත ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමේ සියයට 66 ක හිමිකමක් කාර්යාංශයට තිබුණද එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**(අ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතයේ 82, 83(අ) වගන්ති ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂික වෙන්කිරීම් අනාවරණය කිරීමේදී විශ්‍රාම ගන්වන වයස ඉක්මවූ සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂිකය ජංගම වගකීම් ලෙසත් ඉතිරිය ජංගම නොවන වගකීම් ලෙසත් නිරූපනය කිරීම වෙනුවට රු.131,042,056 ක්වූ මුළු පාරිතෝෂික වෙන්කිරීම, ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි.

* පල්ලෙකැලේ සුනාමි සන්නිවේදන මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු සඳහා විදේශ විශ්ව විද්‍යාලයකින් ලැබී තිබුණු මුදලින් ඉතිරි වූ රු.7,821,979 ක් ජංගම නොවන වගකීමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට මුළු ශේෂයම ජංගම වගකීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 118 වගන්තිය ප්‍රකාරව ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ ස්කන්ධය යටතට නොගැනෙන රු.25,560,400 ක් වූ අරමුදල් 2 ක් හා රු.10,400 ක ප්‍රදානයක් ස්කන්ධය යටතේ දක්වා තිබුණි.

(iii) ප්‍රමිතයේ 82, 83(අ) වගන්ති ප්‍රකාරව සටහන් මගින් හෙළිදරව් කළ යුතු කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාල 16 පිළිබඳව හා අනෙකුත් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03**

ගොඩනැගිලි ක්ෂය අනුපාතය සියයට 20 සිට සියයට 5 දක්වා අඩුකර තිබුණද එකී වෙනස්වීම පිළිබඳව ප්‍රමිතයේ 44 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ප්‍රමිතයේ 69 වගන්තිය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම වත්කම භාවිතයට ගත් දිනයේ සිට ආරම්භ කළ යුතු වුවද රු.525,923,903 ක් වූ දේපල, පිරියත හා උපකරණ මිලදී ගත් මාසයේ අවසන් දිනට පැවති අගය මත ක්ෂය කර තිබුණි.

## 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොග නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වත්කමක අවම වටිනාකම ගිණුම් ප්‍රතිපත්ති මගින් අනාවරණය කර නොතිබුණි.

(ඇ) දේශීය හා විදේශීය රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා ආයතනය විසින් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ප්‍රදාන රු.10,399 ක් හා විදේශීය ප්‍රදාන රු.16,968,107 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්කන්ධය යටතේ දක්වා තිබුණි.

## 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවාදායකයන් වෙනුවෙන් මිලදීගෙන ඔවුන් විසින් වියදම ප්‍රතිපූරණය කරන ලද රු.2,046,540 ක් වටිනා වත්කම් කාර්යාංශයේ වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) කාර්යාංශය සතුව පැවති රු.199,962,533 ක් වටිනා ඉඩම් ඉකුත් වර්ෂවලදී නීත්‍යානුකූලව වෙනත් රාජ්‍ය ආයතනවලට පවරා තිබුණද, ඒවා තව දුරටත් ගිණුම්වල ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් කාර්යාංශය වෙත පවරන ලද පර්චස් 129 ක ඉඩම හා ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ගොඩනැගිල්ල පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂයට අදාල පාරිතෝෂික වියදම රු.13,892,899 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.13,282,442 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් පාරිතෝෂික වියදම රු.610,457 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික ලෙස රු.5,447,160 ක් මුදලින් ගෙවා තිබුණද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කිරීමේදී, කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ගැලපුම් කළ යුතු පාරිතෝෂික අරමුදල් පොලිය රු.646,884 ක් හා පාරිතෝෂික ගෙවීමේදී අයකර ගන්නා ලද රු.2,570,304 ක ආපදා ණය ගැලපුම් කර පාරිතෝෂික ගෙවීම් ලෙස රු.7,370,580 ක් දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ දිරිදීමනා ඌන ප්‍රතිපාදනය වූ රු.1,161,325 ක් රඳවාගත් ඉපයුම්වලට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබුණි.

(උ) ආයෝජන ආදායම්වලින් රඳවාගන්නා ලද බදු රු.6,156,849 ක් ගිණුම්වල දක්වා නොතිබීම හේතුවෙන් ආදායම් හා වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) කාර්යාංශයේ සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද රු.33,514,439 ක් වුවද රඳවා ගැනීම් බදු හිලව් කිරීමෙන් පසු ගෙවිය යුතු ආදායම් බදු ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.27,315,639 ක් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී විශ්ලේෂණ රසායනාගාරයේ වර්ෂ අවසානයට ඉතිරිව තිබූ ඇසිඩ් බෝතල් 52 ක් හා විවිධ රසායන ද්‍රව්‍ය බෝතල් 171 ක් ගණනය කර අවසාන තොග ලෙස දක්වා නොතිබුණි.

(ඒ) ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගම විසින් කාර්යාංශය වෙනුවෙන් 2011 වසරේ සිට 2016 දක්වා දරන ලද කාර්ය මණ්ඩල, කාර්යාල අළුත්වැඩියා හා ව්‍යාපෘති වියදම් පිළිවෙලින් රු.9,499,181 ක්, රු.1,450,874 ක් හා රු.1,618,283 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.157,752,554 ක් වූ වෙළඳ හා අනෙකුත් ණයගැතියන්ගෙන් රු.1,671,390 ක් වර්ෂ 5 ඉක්මවා තිබුණ ද ඒ වෙනුවෙන් බොල්ණය වෙන්කිරීම් කර නොතිබුණි.

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

---

මූල්‍ය ප්‍රකාශන හා භෞතික සමීක්ෂණ වාර්තා සැසඳීමේදී රු.668,527 ක් වටිනා පොත් හා සිතියම් තොගයක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

වසර 23 ක සිට පැවතෙන විදේශ ප්‍රදාන මගින් ලැබුණු රු.1,984,210 ක් වූ වත්කම් තහවුරු කිරීමට අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේදී භාණ්ඩ හා සේවා බදු අවලංගු කර තිබුණද වැඩිපුර ගෙවා තිබූ රු.973,143 ක් අදාළ වර්ෂවලදී නිරවුල් නොකිරීම හේතුවෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) කාර්යාංශයේ හිටපු සභාපතිවරයෙකුට මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා 2014 වර්ෂයේ ලබා දී තිබූ රු.1,500,000 ක අත්තිකාරම් පියවාගැනීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 26(1) හා 44(ආ) වගන්ති | රජය වෙනුවෙන් කාර්යාංශය විසින් අයකර ගන්නා රාජ්‍යභාග මුදල් භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත් 2014, 2015 හා 2016 වර්ෂවල ලැබුණු පිළිවෙලින් රු.428,601,622 ක් රු.438,810,229 ක් හා රු.568,348,602 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 9(2)(ඊ)වගන්තිය | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබූ රු. 1,010,235,812 ක් වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ස්කන්ධය අඩුවීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. |
| | 11 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.250,271,935 ක් භාණ්ඩාගාර බිල්පත්වල හා රු.1,362,072,135 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණ ද ඊට අදාළ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 6(2)(අ) ඡේදය | පාරිතෝෂික ගණනය කිරීමේදී මාස භාගයක වැටුප වෙනුවට 2015 වර්ෂයේ සිට මාසයක වැටුප පදනම් කරගෙන ගණනය කිරීම හේතුවෙන් නිලධාරීන් 10 දෙනෙකුට රු.4,580,276 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | (i) XXIV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආපදා ණය ගෙවීමේදී දළ වැටුප පදනම් කරගෙන හා රු. 250,000 ක උපරිම සීමාව ඉක්මවා නිලධාරීන් 133 කට ගෙවීම හේතුවෙන් රු.31,991,022 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| | (ii) XXX පරිච්ඡේදයේ 1.4 හා 1.4.1 වගන්ති | ලේකම්වරයාගේ අවසරයකින් තොරව නිලධාරීන් තිදෙනෙකු විසින් කාර්යාංශයට අනුබද්ධිත ආයතනයකට වෘත්තිමය සේවා සැපයීම සිදුකර ඉකුත් වර්ෂයේ උපයාගෙන තිබුණු රු.1,969,500 ට අදාළව ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කාර්යාංශය වෙත අයකර ගත යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | |
| | (i) මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේදී සිදු වූ වාහන අනතුරු 26 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 371(5) | සමාලෝචිත වර්ෂය අවසානයේ නොපියවූ රු.1,382,800 ක උපඅග්‍රිම ශේෂ පියවා ගැනීමට කටයුතු නොකර මුදල් හා මුදල් සමාන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 396 | නිකුත් කර මාස 6 ඉක්මවූ රු. 654,830 ක් වූ චෙක්පත් 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 757 | ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල හා රසායනාගාරවල ස්ථාවර වත්කම්වලට අදාළව තොග සමීක්ෂණය සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.3.1 වගන්තිය | 2016 වර්ෂය සඳහා වූ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ විගණන හා කළමනාකරණ කමිටු වාර්තා ඇතුළත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,564,027,187 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.1,037,093,870 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.526,933,317 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාලවල මෙහෙයුම් වියදම් රු.30,679,940 කින් හා දිරිදීමනා වෙන්කිරීම රු.30,000,000 කින් වැඩිවී තිබුණද, රාජ්‍ය භාග ආදායම රු.285,151,382 කින්, බලපත්‍ර ගාස්තු රු.144,795,562 කින්, පරීක්ෂණ ගාස්තු රු.65,010,116 කින්, මූල්‍ය ආදායම් රු.47,378,282 කින් හා වෙනත් ආදායම් රු.22,790,816 කින් වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ ලාභයේ අඩුවීමක් පෙන්නුම් කළද 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව ලාභයේ වර්ධනයක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු කාර්යාංශයේ දායකත්වය 2012 වර්ෂයේ රු.907,668,917 ක් වූ අතර 2016 වර්ෂයේදී රු.2,081,082,775 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

කාර්යාංශයට විරුද්ධව බාහිර පාර්ශවයන් විසින් නඩු 17 ක් හා කාර්යාංශය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 07 ක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත අනුව භූ විද්‍යා සිතියම් සැකසීම, ඛණිජ සම්පත් හඳුනා ගැනීම, ගවේෂණය හා කැණීම, ඒවා වෙළඳාම් කිරීම හෝ අපනයනය විධිමත් කිරීම කාර්යාංශයේ ප්‍රධාන අරමුණු විය. අරමුණු ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ කාර්යයන් අතරින් භූ විද්‍යා සිතියම් සකස් කිරීම, ඛනිජ සම්පත් හඳුනාගැනීම සහ ඒවා තක්සේරු කිරීමේ කටයුතුවල ප්‍රගතිය මන්දගාමී තත්ත්වයක තිබූ අතර පතල් කැනීමේ වාණිජමය ශක්‍යතාවය පිළිබඳව ඇගයීම ද, ඛනිජ සකස් කිරීම, වාණිජමය පදනමක් මත ඛනිජ නිෂ්කර්ෂණය කිරීම, වටිනාකම් එකතු කිරීම සහ අපනයනය සඳහා උපයෝගී කරගත යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම යන කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි.

(ආ) කාර්යාංශයේ භූ විද්‍යා අංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 ක්‍රියාකාරී සැලැස්ම අනුව භූ විද්‍යා අංශය විසින් ඉටු කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් 12 ක් සඳහා රු.58,539,100 ක් වෙන් කර තිබුණද අදාළ කාර්යයන්ගේ වාර්ෂික/කාර්තුමය කාර්යසාධන වාර්තා පිළියෙල කර හෝ එක් එක් කාර්ය සඳහා අවශ්‍ය ලිපිලේඛන පවත්වා හෝ නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධනය හා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ දක්වා තිබූ ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ii) වසරේ ඛණිජ අත්පොත -2015 නිකුත් කිරීමට 2017 ජූලි 31 දින දක්වා අසමත්ව තිබූ අතර පුස්තකාලය හා කෞතුකාගාරය සඳහා රු.මිලියන 6.8 ක් වෙන්කර තිබුණද අදාළ අංශවල ප්‍රමාණවත් භෞතික හා මූල්‍ය කාර්යසාධනයක් සමාලෝචිත වර්ෂයේදී ද පෙන්නුම් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළඹ වරාය නගරය ඉදිකිරීම සඳහා කැණීම් කර තිබූ මුහුදු වැලි කියුබ් 3,909,669 ක් සඳහා අයවිය යුතු රාජ්‍යභාග රු.465,546,966 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝකිරීමේ ව්‍යාපෘතිය සඳහා නිකුත් කර තිබූ බලපත්‍ර 4 කට අදාළව බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් සිදුකර තිබූ පස් කැපීම හේතුවෙන් අයවිය යුතු රු.3,001,788 ක රාජ්‍යභාග මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද කැණීම් කටයුතු පිළිබඳ නිසි අධීක්ෂණයක් හෝ බලපත්‍ර දීර්ඝ කිරීමේදී නිසි ඇගයීමක්ද කාර්යාංශය විසින් සිදු කර නොතිබුණු අතර එක් බලපත්‍රලාභියෙකු කොන්දේසි කඩකර තිබියදී පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 36(අ) වගන්තියට පටහැනිව බලපත්‍ර අලුත් කර දී තිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල සඳහා සේව්‍ය හා සේවක දායකත්වය 3:2 අනුපාතයට විය යුතු වුවත් කාර්යාංශයේ සේව්‍ය දායකය සියයට 12 ක් හා සේවක දායකය සියයට 10 ක් වීමෙන් සේව්‍ය දායකත්වය සියයට 3 ක් අඩුවෙන් ගෙවා තිබුණි. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක දායකත්වය පිළිබඳ කිසිදු තොරතුරක් ගිණුම් සටහන්වල හෙළිදරව් කර ද නොතිබුණි.

(ඈ) කාර්යාංශයේ අරමුණුවලට පටහැනිව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සම්බන්ධිත කාර්යයන් 4 ක් සඳහා රු.6,000,000 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විවිධ ආයතනවලට ගෙවා තිබුණි. මීට අදාළ ලිපිගොණු හා වැයකිරීම් තහවුරු කිරීමේ ලියවිලි විගණනයට ඉදිරිපත් කර ද නොතිබුණි.

(ඉ) නීති විරෝධී කැනීම් පාලනය සඳහා වැටලීම් ඒකකයක් ස්ථාපිත කර නොතිබීම නිසා දීප ව්‍යාප්තව නිරන්තරයෙන් අනවසර කැනීම් සිදු වුවත් ඒ සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට හා බලපත්‍රයේ සඳහන් අනුමත ප්‍රමාණය ඉක්මවා කැනීම් කර ඇති අවස්ථාවලදී වැඩිපුර කැනීම් කර ඇති ප්‍රමාණය සඳහා රාජ්‍යභාග අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(ඊ) ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නිලධාරීන් යෙදවීමේදී අනුරාධපුර, වවුනියාව හා මන්නාරම යන දිස්ත්‍රික්ක 03 හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 32 ක් ආවරණය කිරීමට ක්ෂේත්‍ර සහායකයින් දෙදෙනෙකු පමණක් යොදවා තිබුණි.

(උ) රජයේ ප්‍රතියාන්ත්‍රණය කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා 2012 වර්ෂයේදී පද්ධති අධ්‍යයනයක් සිදුකිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට රු.1,505,000 ක් ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂය දක්වාම එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඌ) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු ඛනිජ වැලි ගවේෂණ බලපත්‍ර 42 කට අදාල ගවේෂණ ප්‍රතිඵල මත කැණීම් බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(එ) 2012 නොවැම්බර් 14 දිනැති අංක 12/1383/527/0121 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර ඛණිජ වැලි කැණීම පාරිසරික හා සමාජීය බලපෑම් අවමවන ආකාරයෙන් නීති රීතිවලට අනුගත වෙමින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සඳහා යෝජනා කැඳවීමේ ලියවිල්ලක් සකස් කළ යුතු වුවත් වසර 4 ක් ගතවී ඇතත් එවැනි ලියවිල්ලක් සකස් කර නොතිබුණි. එම අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඛනිජ වැලි කැණීම් හා අපනයන කටයුතු සිදු කරන ආයතන අගය එකතු කිරීම නිසි ආකාරයෙන් සිදු කරන්නේද යන්න පසුවිපරම් කළ යුතු වුවත් ඒ සඳහා ද පියවර ගෙන නොතිබුණි.

(ඒ) බලපත්‍ර නිකුත් කිරීමේදී ඊට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට පෙර අයදුම්පත සමඟ සම්පූර්ණ බලපත්‍ර ගාස්තුවත් ඊට අදාල එකතු කළ අගය මත බදු හා මුද්දර ගාස්තුද අයකර තිබුණි. මීට අමතරව බලපත්‍රය මගින් කැනීම් කරන ඛණිජ ප්‍රමාණය මත අයකළ යුතු රාජ්‍ය භාගය සඳහා අත්තිකාරම් මුදලක් අයකර තිබුණි. මේ හේතුවෙන් බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි අයදුම්පත්වලට අදාලව විශාල මුදලක් කාර්යාංශයේ නිරන්තරයෙන් සමුච්චිතව පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි එකතුව රු.170,361,042 ක් විය.

(ඔ) කූඨ ලේඛන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධ විෂමාචාර ක්‍රියා

---

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය ප්‍රකාරව කූඨ ලේඛණ සැකසීම සම්බන්ධයෙන් සිදුකළ මූලික විමර්ශන වාර්තාවකට අනුව, නිලධාරීන් 6 දෙනෙකු චූදිතයන් ලෙස හඳුනාගෙන තිබුණ ද, ඉන් නිලධාරීන් තිදෙනෙකුට පමණක් චෝදනාපත්‍ර නිකුත් කර තිබුණි.

(ii) නිලධාරීන් දෙදෙනෙකුගේ වැඩ තහනම් කළ යුතු බවට මූලික විමර්ශන වාර්තාවෙන් නිර්දේශ කර තිබියදී ස්ථාන මාරුකිරීම් පමණක් සිදු කර තිබු අතර එක් නිලධාරියෙකු විදේශ වැඩමුළුවක් සඳහා සහභාගී කරවීම වෙනුවෙන් රු. 130,118 ක් වැයකර තිබුණි.

(iii) මේ සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.

(ඕ) කැණීම් කටයුතුවලින් අනතුරුව පරිසරය ප්‍රතිසංස්කරණය කිරීමට බලපත්‍රලාභීන් කටයුතු නොකිරීම හේතුවෙන් 2009 වසරේ සිට රු.52,014,000 ක් වූ බැංකු ඇපකර කාර්යාංශය වෙත පවරා ගෙන තිබුණ ද කොන්දේසි කඩකළ බලපත්‍රහිමියන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට හෝ ඔවුන් අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. මෙහිදී අදාළ පරිසර ප්‍රතිසංස්කරණ කටයුතු ඉටුවී නොතිබීම හේතුවෙන් පැනනැගී ඇති පාරිසරික හා සාමාජීය ගැටලු සම්බන්ධයෙන් කාර්යාංශයේ අවධානය යොමුකර නොතිබුණි.

## (ක) උමාඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා කැණීම් බලපත්‍ර නිකුත් කිරීම

උමාඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයේ පුහුල්පොල වේල්ල හා පුහුල්පොල ජලාශය ඩයිරබා ජලාශයේ මීටර් 3870 ක් දිග සම්බන්ධක උමඟ ඉදිකිරීමට අදාළ කැණීම්වලදී කැණීම් බලපත්‍රවල හා ඊට අදාළ පරිසර ආරක්ෂණ බලපත්‍රවල සඳහන් පිපිරුම් සීමාවන් ඉක්මවා තිබූ අවස්ථා හා ඒ පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) සම්බන්ධක උමඟ ඉදිකිරීම සඳහා 2015 දෙසැම්බර් සිට 2016 නොවැම්බර් දක්වා කාලය තුළ සිදුකර තිබූ පිපිරුම් 2034 කින් පිපිරුම් 269 කට නියමිත භූකම්පන සීමාව වූ 5mm/sec සීමාව, 19.6mm /sec ක් දක්වා ඉක්මවා තිබුණි.

(ii) පුහුල්පොල වේල්ල ඉදිකිරීම සඳහා 2015 දෙසැම්බර් සිට 2016 නොවැම්බර් දක්වා කාලය තුළ සිදුකර තිබූ පිපිරුම් 1607 කින් පිපිරුම් 170 කට නියමිත වායු පිපිරවීම් පීඩන සීමාව වූ 120db සීමාව ඉක්මවා තිබුණි.

(iii) මෙම සීමා ඉක්මවීම් පිළිබඳ අධීක්ෂණ සමාගම විසින් කාර්යාංශයටද පිටපත් සහිතව කොන්ත්‍රාත්කරුට දැනුම්දී තිබුණද කොන්ත්‍රාත්කරු ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එම කටයුතු පාලනය කිරීම සඳහා කැණීම් බලපත්‍ර නිකුත් කළ කාර්යාංශය විසින්ද ප්‍රමාණවත් පියවර නොගෙන 2016 මාර්තු 24 දින සිට සම්බන්ධක උමඟ සඳහා වූ කැණීම් බලපත්‍රය දීර්ඝ කර දී තිබුණි.

(iv) සීමාව ඉක්මවන පරිදි පිපිරුම් කර ඇති බව අනාවරණය වී තිබියදීත්, 2015 ඔක්තෝබර් 02 සිට වසරක් සඳහා සම්බන්ධක උමඟ වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරිය ලබාදුන් පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් පිපිරුම් පරාමිතයන් කාර්යාංශය විසින් අදාල වසර තුළ දෙවරක් වැඩිකරදී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | **නියමිත පරාමිතිය** | **පරාමිතීන් වැඩි කිරීම** | |
|---|---|---|---|
| | | **2015 දෙසැම්බර් 04** | **2016 මැයි 13** |
| උපරිම බෝර සිදුරු සංඛ්‍යාව | 45 | 80 | 75 |
| උපරිම බෝර ගැඹුර | 2.2 m | 3  m | 3m |
| එක් පිපිරුමක් සඳහා භාවිතා කල යුතු ද්‍රව්‍ය ප්‍රමාණ | | | |
| Emulsion | 91 kg | 140 kg | 149.2 kg |
| ANFO | 12.7 kg | 40 kg | 48.4 kg |
| Nonnel Detonator | 75 | 80 | 75 |
| Electric Detonator | 06 | 10 | 08 |
| Detonator Code | 3 m | 3 m | 10 m |

(i) ව්‍යාපෘතියේ ඩයිරබා වේල්ල හා මීටර් 15,650 ක් දිග ප්‍රධාන උමඟ ඉදිකිරීමේදී කොන්ත්‍රාත්කරු කැණීම් බලපත්‍ර ලබා නොගෙන කැණීම්කර තිබුණද ඒ සඳහා කාර්යාංශය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ග) **දිරිදීමනා ගෙවීම**

---------------------

සමාලෝචිත වර්ෂයේදී රු.71,161,325 ක දිරිදීමනා ගෙවීම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 1996 අගෝස්තු 02 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් කාර්යසාධනය පදනම් කරගත් දිරි දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද එවැනි දිරිදීමනා යෝජනාක්‍රමයක් සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) දිරිදීමනා සඳහා අදාල කර නොගත යුතු ශුද්ධ ඉපයීම් රු.144,326,648 ක් දිරිදීමනා ගණනය කිරීමේදී පදනම් කරගෙන තිබුණි.

(iii) දිරිදීමනා ගෙවීම සඳහා කාර්යසාධන නිර්ණායක 04 ක් මත ලකුණු ලබාදී තිබුණ ද ඒවා පදනම් කර ගෙන නොතිබුණු අතර සියළු සේවකයන්ට කාර්යසාධන මට්ටම නොසලකා මාස 10 ක දිරිදීමනා ලබා දී තිබුණි.

(iv) සියලු සේවකයන්ට වගකීම් පැවරෙන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබිය දී කාර්යසාධන ඇගයීමේ ලකුණු වලින් සියයට 45 ක් ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධනය සඳහා ලබාදී තිබීමත් සේවක පැමිණීම හා නිවාඩු දිරිදීමනා ගෙවීමේ දී සලකා බලා නොතිබීමත් මතභේදයට තුඩු දී තිබුණි.

(v) දිරිදීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලැබූ මුදලින් සියයට 05 ක් එනම් රු.3,823,563 ක් හදිසි ආපදා අරමුදල නම් වූ භාණ්ඩාගාර අනුමැතිය නොලත් සුභසාධන අරමුදලකට බැර කර තිබුණි.

(vi) දිරිදීමනා ගණනය කිරීමේදී පදනම් කරගන්නා ලද ශුද්ධ ඉපයීම තීරණය කිරීමේ දී ආදායමෙන් පොදුකාර්ය වියදම් සියයට 15 ක් අඩුකර තිබුණද එම ප්‍රතිශත තීරණය කිරීමේ පදනම විගණනයට හෙළිදරව් නොකෙරුණි.

(ජ) විගණන විමසුම් සඳහා අප්‍රමාදව ක්‍රියාකර පිළිතුරු සැපයීමට කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළ විගණන විමසුම් 04 ක් සඳහා 2017 සැප්තැම්බර් 30 වනවිටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඛනිජ වැලි ගවේෂණ හා කැණීම් බලපත්‍ර නිකුත් කිරීම

--------------------------------------------------------------

(i) 2010 වර්ෂයේ වාකරේ ප්‍රදේශයේ ඛණිජවැලි කැණීම් බලපත්‍ර අයදුම් කර තිබුණු පුද්ගලික සමාගමක් වෙත ඒවා නිකුත් නොකර ගවේෂණ බලපත්‍ර දෙවරක් අලුත් කර දී තිබුණි. එම සමාගම නීතිමය ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීමේ දී ඇති වූ එකඟතාවය මත පතල් හා ඛණිජද්‍රව්‍ය පනතට පටහැනිව 2014 දෙසැම්බර් 09 දින සිට වසර 10 ක කාලයකට හෙක්ටයාර 06 ක් හා හෙක්ටයාර 19 ක් සඳහා ඛණිජවැලි කැණීම් බලපත්‍ර 02 ක් නිකුත් කර තිබුණි.

(ii) 2012 නොවැම්බර් 14 දිනැති අංක 12/1383/527/0121 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර දේශීය වශයෙන් අගය එකතු කර නිමවුම් නිෂ්පාදනය කිරීමට කැමති ආයෝජකයින්ට පමණක් ගවේෂණ හෝ කැණීම් බලපත්‍ර නිකුත් කළ යුතු බවට වූ නියමයන් නොසලකා මෙම බලපත්‍ර නිකුත් කර තිබුණි. එසේ වුවද එම තත්ත්වයේම පැවතුණු රාජ්‍ය සමාගමක් කෝකිලායි ප්‍රදේශයේ ඛණිජවැලි කැණීම් සඳහා 2015 වර්ෂයේ ඉල්ලුම් කළ කැණීම් බලපත්‍රය අමාත්‍ය මණ්ඩල තීරණය හේතුකොටගෙන ලබානොදී ගවේෂණ බලපත්‍ර දීර්ඝ කරදීම පමණක් සිදුකර තිබුණි.

(iii) කැණීම් බලපත්‍ර වර්ෂයකට ලබාදී, වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව වාර්ෂිකව බලපත්‍රය දීර්ඝ කළ යුතු වුවත් අදාල බලපත්‍ර වර්ෂ 10 ක කාලයකට ලබාදීම හේතුවෙන් නියමිත ක්‍රමවේදය අනුගමනය කළ නොහැකි වී තිබුණි.

(iv) සමාගම මෙම බලපත්‍ර 2 ට අදාළව 2014 වර්ෂයේ සිට 2017 ජූනි දක්වා කිසිදු කැණීම් කටයුත්තක් සිදු කර නොතිබුණද, 1993 නොවැම්බර් 26 දිනැති අංක 794/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් කාර්යාංශයට පැවරී ඇති බලතල ප්‍රකාරව බලපත්‍ර අවසන් කිරීමට හෝ ගවේෂණ බලපත්‍ර බවට වෙනස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) අදාළ පුද්ගලික සමාගම ඛණිජවැලි පිළිසකර කර ලබා ගන්නා නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අපනයන බලපත්‍ර ලබා ගෙන තිබූ අතර අපනයනය කරන ඛණිජ සඳහා රාජ්‍යභාග ගෙවීමේදී නැව තෙක් නොමිලේ වටිනාකමට (FOB) සාවද්‍ය ලෙස ගණනය කිරීම හේතුවෙන් රාජ්‍යභාග අඩුවෙන් ගෙවා තිබුණි. විගණනය විසින් සිදු කළ නියැදි පරීක්ෂණය අනුව චුම්බක නොවන බැර ඛණිජ සාන්ද්‍රිත (Non Magnetic Heavy Mineral Concentrate) මෙට්‍රික් ටොන් 8000 ක් චීනයට අපනයනය කිරීමේදී රු.3,131,588 ක් රාජ්‍යභාග අඩුවෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(vi) තෙවික්කාලු ප්‍රදේශයේ ඛණිජ වැලි කැණීම සඳහා රාජ්‍ය සමාගමකට නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන එම රාජ්‍ය සමාගමේ එකඟතාවයකින් තොරව මාස 3 ක කාලයකට මෙම පෞද්ගලික සමාගම වෙළඳ බලපත්‍රයක් ලබාගෙන තිබුණි. එම බලපත්‍රය මත තෙවික්කාලු ප්‍රදේශයේ කණින ලද ඛණිජ වර්ග බව දක්වමින් මෙට්‍රික් ටොන් 13,373 ක් අපනයනය කර තිබුණද එම ප්‍රදේශයෙන් කැණීම් සිදු කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමකින් තොරව කාර්යාංශය අපනයන බලපත්‍ර ලබාදී තිබුණි.

(ආ) සිලිකා වැලි කැණීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම
-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පුත්තලම් දිස්ත්‍රික්කයේ නාත්තන්ඩිය, මාදම්පේ හා මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ස්ථානගතව ඇති සිලිකා වැලි නිධි පිළිබඳ ගවේෂණය කිරීමට, සිතියම් ගත කිරීමට හා එම පතල් කැණීමේ වාණිජමය ස්වශක්තිතාවය පිළිබඳ ඇගයීම් කිරීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(ii) බලපත්‍ර 08 ක් ලබාදීමේ දී අනුමත කැණීම් ගැඹුර ලෙස අඩි 10 – අඩි 15 දක්වා තිබුණ ද ගවේශණයක් සිදු කර නොතිබිය දී කැණීම් ගැඹුර තීරණය කළ ආකාරය මතභේදයට තුඩු දී තිබුණි.

(iii) බලපත්‍රලාභීන් විසින් කැණීම් වලවල් වල ගැඹුර, සක්‍රීය කැණීම් ප්‍රදේශය, ඉඩම් මායිම්වල සිට තැබිය යුතු දුර, කැණීම් වලවල්වල බෑවුම අනුමත සීමාව ඉක්මවා තිබීම, කොන්දේසි ප්‍රකාරව කැණීම් වලවල් ප්‍රතිසංස්කරණය කර නොතිබීම හා ප්‍රතිසංස්කරණය නොකර අතහැර දැමීම සහ පරිසර අධිකාරියේ හා ජල සම්පත් මණ්ඩල නිර්දේශ ප්‍රකාර කටයුතු නොකිරීම ආදී වූ බලපත්‍ර කොන්දේසි කඩකර තිබුණ ද ඒ පිළිබඳ පසු විපරම් කිරීමට කටයුතු නොකර බලපත්‍ර අලුත් කිරීම, නව බලපත්‍ර නිකුත් කිරීම හා ඇප මුදල් නිදහස් කිරීම සිදුකර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දී කාර්යාංශයේ නොවන නිලධාරීන් දෙදෙනෙකු විදේශ පුහුණුවකට යැවීම වෙනුවෙන් සංයුක්ත දීමනා හා වෙනත් වියදම් ලෙස කාර්යාංශය විසින් රු. 953,258 ක් ගෙවා තිබුණද අදාල මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු විසින් ලබාගෙන තිබූ රු. 597,231 ක් වටිනා උපකරණ ආපසු භාර දී නොතිබූ අතර එම අලාභ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 35 හා 44 වගන්ති ප්‍රකාරව අයකර ගත යුතු බලපත්‍ර ගාස්තු අයකර ගැනීමෙන් තොරව වරාය නගරය සඳහා මුහුදුවැලි කැණීම පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත නිකුත් කර තිබූ 2014 සැප්තැම්බර් 16 දිනැති අංක IML/A/HO/ 8328 දරන බලපත්‍රයට අදාළ රු.68,000,000 ක ගාස්තුව ලබා නොගැනීම හා 2016 ට පෙර කැණීම් කරන ලද මුහුදු වැලි කියුබ් 3,485,823 ක් සඳහා අයවිය යුතු රු.557,731,680 ක රාජ්‍යභාග මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.625,731,680 ක් කාර්යාංශයට අහිමිවී තිබුණි.

(ඇ) **යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය**

(i) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන චීන සමාගම ඇතුළු බලපත්‍රලාභීන් 41 ක් සඳහා ලබාදුන් වැලි කැණීම් බලපත්‍ර මත සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රාජ්‍යභාග රු.34,215,010 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි.

(ii) යාන් ඔය වැලි නිධිය සම්බන්ධයෙන් 1992 අංක 33 දරණ පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 12(ආ) වගන්තිය ප්‍රකාරව භූ විද්‍යාත්මක කැණීම් සිදු කර වැලි ප්‍රමාණය තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 36(ආ) වගන්තියට පටහැනිව බලපත්‍ර 5 ක් සඳහා අයකර ගත යුතු රු.6,100,560 ක රාජ්‍යභාග අයකර ගැනීමෙන් තොරව බලපත්‍ර කාලය දීර්ඝ කර දී තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 407 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 318 ක් විය. ඒ පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) කාර්යාංශයේ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2009 වසරේ සිට උපදේශකවරයකුගේ සේවය ලබා ගන්නා අතර කාර්ය මණ්ඩලය අනුමත කර වසර 04 කට ආසන්නව පැවතුණද ඊට අදාළ බඳවා ගැනීමේ පටිපාටි සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ සේවකයන් 12 ක් ස්ථිර සේවයට බඳවා ගෙන තිබුණි.

(ii) කාර්යාංශයේ ප්‍රධාන ක්‍රියාකාරී කළමනාකරණ ශ්‍රිතයක් වන අධ්‍යක්ෂ(මුල්‍ය) තනතුර සාමාන්‍යාධිකාරී යටතට පත් කර තිබුණි.

(ආ) කාර්යාංශයට අනුබද්ධ සමාගමක් හරහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 92 ක් බඳවාගෙන තිබුණි. ඉන් සේවකයන් 60 ක් අතිරික්ත බඳවා ගැනීම් වූ අතර එම සේවකයන්ට වැටුප් හා දීමනා වශයෙන් මාසකට රු.1,939,995 ක් ගෙවා තිබුණි.

(i) කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගත් සේවකයන්ගේ තනතුරට අදාළ සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කරගෙන නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 315 ප්‍රකාරව වත්කම් භාරකාරිත්වයක් ඇති ගබඩා නිලධාරී තනතුර සඳහා විශ්‍රාමික නිලධාරියෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. ස්ථිර තනතුරට හිමි වැටුපට වඩා ඉහළ වැටුපක් වූ රු.53,004 ක් කොන්ත්‍රාත් නිලධාරියාට ගෙවීමද මතභේදයට තුඩුදී තිබුණි.

(iii) බඳවාගත් කොන්ත්‍රාත් සේවකයන් වෙනුවෙන් වැටුපෙන් සියයට 10 ක ආන්තිකයක් ද සමඟ සමාගමට වැටුප් ප්‍රතිපූරණය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ එසේ ගෙවා තිබූ මුදල රු.3,463,359 ක් විය. කාර්යාංශය සෘජුව සේවකයන් බඳවා ගත්තේ නම් එම මුදල ඉතිරි කරගත හැකිව තිබුණද ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත පිළිවෙලින් 12 ක් හා 92ක් බඳවාගෙන තිබියදී කාර්යාංශය, පුහුණුවන්නන් 148 ක්ද බඳවාගෙන ප්‍රාදේශිය කාර්යාලවලට උපරිමය 20 දක්වා වූ පුහුණුවන්නන් සංඛ්‍යාවක් යොදවා තිබුණි.

(ඈ ) කාර්යාංශයේ අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර මාස 5 කට වැඩි කාලයක් පුරප්පාඩු වී පැවතුණද එම තනතුරට බඳවා ගැනීම සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) කාර්යාංශයේ භූ විද්‍යාඥයින් 8 ක් පුරප්පාඩුව පැවතියදී සේවයේ නියුතු විද්‍යාඥයින් දෙදෙනෙකු 2016 ඔක්තෝබර් 17 දින සිට විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදාහැර තිබූ අතර මෙම නිලධාරීන්ට ගෙවූ රු.429,966 ක වැටුප් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වූ කාර්යාංශයේ නිළධාරීන් සිව්දෙනෙකු ගිවිසුම් ප්‍රකාර අනිවාර්ය සේවාකාලය සම්පූර්ණ කිරීමකින් තොරව සේවයෙන් ඉවත්වී තිබුණි. ගිවිසුම් කඩ කිරීම නිසා නිලධාරීන්ගෙන් අය කර ගත යුතු දණ්ඩන මුදල් සහ අනෙකුත් වියදම් රු.2,459,663 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

**4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඩමේ සිදුකරන සංවර්ධනයන් හා ඉදිකිරීම්වල අයිතිය බදු කාලය අවසානයේ බදු දීමනාකරුට හිමිවන බවත් ඒ සම්බන්ධයෙන් කිසිදු දීමනාවක් ඉල්ලා සිටීමට බදු ගැණුම්කරුට අයිතියක් නොමැති බවත් ගිවිසුමේ සඳහන්ව තිබියදී කාර්යාංශය විසින් කල්බදු පදනම මත ලබාගෙන තිබූ වැරැල්ලවත්ත ඉඩමේ රු. 46,035,957 ක් වැය කර ගොඩනැගිලි 02 ක් ඉදිකර තිබුණි.

(ආ) ඉඩමේ අයිතිය පවරා ගැනීමෙන් තොරව 2014 වර්ෂයේම රු.4,040,144 ක් වැයකර අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය ඉදිකර තිබුණි. එහිදී සැලසුම් ප්‍රකාරව ඉදි කිරීම සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා ලිපිගොනු අනාරක්ෂිතව පැවතීම යන අඩුපාඩු ද නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2015 – 2017 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂයේ දී යාවත්කාලීන කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංයුක්ත සැලැස්මේ දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම සඳහා දායක වන සෑම අංශයක් සඳහාම භෞතික හා මූල්‍ය කාර්යසාධන ඉලක්ක හා වගකීම් ලබාදෙමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

(ආ) කාර්යාංශයේ අංශ 11 ක හා ප්‍රාදේශීය කාර්යාල 14 හි කාර්යභාරය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ක්‍රියාකාරකම්වල මුළු භෞතික ඉලක්ක දක්වා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශයට අනුමත කර තිබූ නිලධාරීන් 4 දෙනෙකුගෙන් යුතු ස්ථිර සහායක විගණන කාර්ය මණ්ඩලය පත් කර නොතිබූ අතර අභ්‍යන්තර විගණක කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක තබා තිබුණි. මේ හේතුවෙන් අභ්‍යන්තර විගණකගේ බලතල සීමාවීමක් සිදුව තිබුණි.

(ආ) අභ්‍යන්තර විගණකගේ විගණනය පිළිබඳ වෘත්තීය දැනුම වර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 133(2) ප්‍රකාර කාර්යාංශයේ සියළු ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි විධිමත් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර භූ විද්‍යා අංශයේ ඒකක 03 ක් හා මානව සම්පත් අංශයේ ක්‍රියාකාරකම් 12 ක් විගණන සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර ඒවා විගණනයට ලක්කර නොතිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ඉටුකළ යුතුව තිබූ භූ විද්‍යා අංශයට අදාල විගණන පරීක්ෂණ කාර්යයන් 12 ක් ඉටුකර නොතිබුණි.

## 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------------

2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2017 මැයි මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 11 සිට සියයට 226 දක්වා හා අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 12 සිට සියයට 295 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

තවද ඇස්තමේන්තු කර නොතිබූ ආදායම් මූලාශ්‍ර 4 කින් රු.මිලියන 2.9 ක් උපයාගෙන තිබුණි, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,592,292 ක ශේෂයක් පැවති ආපදා අරමුදල අයවැය ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අතුළත්ව නොතිබුණි.

## 5.6 පරිසර හා සමාජ වගකීම් ඉටු කිරීම

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාරිසරික හා සාමාජීය ගැටලු හේතුවෙන් මන්නාරම් දූපත තුළ වාණිජමය වැලි කැණීම් සඳහා බලපත්‍ර නිකුත් නොකිරීමට කාර්යාංශය කටයුතු කර තිබුණ ද වාණිජමය නොවන වැලි කැණීම් බලපත්‍ර උපයෝගී කරගෙන සිදුකරන අනවසර වැලි කැණීම් බහුල වීමත් එවැනි කැණීම් නවතාලීම සඳහා කාර්යාංශය මැදිහත් නොවීමත් හේතුවෙන් කාර්යාංශය අපේක්ෂා කළ පරිදි ගැටලු පාලනය වීමක් සිදුව නොතිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සිලිකා වැලි කැණීම්වලින් අනතුරුව කැණීම් වලවල් වැසීමේදී ප්‍රදේශයේ භූගත ජල මට්ටම හා ජලයෙහි ගුණාත්මක බව රැක ගැනීම සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් කර තිබූ නිර්දේශ වලට පටහැනි ආකාරයෙන් කාර්යාංශය බලපත්‍ර නිකුත් කර තිබුණි.

(ඇ) බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් සිදුකරනු ලබන ඛණිජ ද්‍රව්‍ය ඉවත් කිරීම් හේතුවෙන් උග්‍ර පාරිසරික හා සමාජීය ගැටලු පැන නැගී ඇති බව අනාවරණය වුවද එවැනි කැණීම් වළකාලීම සඳහා කාර්යාංශය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

--------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | පොත්පත් පවත්වා ගැනීමේ හා ගිණුම්කරණ දෝෂ මෙන්ම ගිණුම්කරණ ප්‍රමිති හා ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කර නොතිබීම. |
| (ආ) ගබඩා පාලනය | රසායනාගාරවල තොග ලැබීම්, නිකුත් කිරීම් හා සටහන් කිරීම් නිසි පරිදි සිදුකර නොතිබීම. |
| (ඇ) ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම | ක්ෂේත්‍ර පරීක්ෂණවලදී අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත් පිළිබඳ උපදෙස් නිකුත් නොකිරීම, දින පොත් භාවිතා නොකිරීම, මාසික කළ වැඩ වාර්තා හා ඉදිරි වැඩසටහන් ඉදිරිපත් නොකිරීම, ක්ෂේත්‍රයන්හි පැවති අඩුපාඩු හා කොන්දේසි කඩවීම් ප්‍රාදේශීය කාර්යාල වලට වාර්තා නොකිරීම. |
| (ඇ) වැලි කැණීම් බලපත්‍ර අලුත්කිරීම | වැලි කැණීම් බලපත්‍ර අලුත්කිරීමේදී ප්‍රමාද ගාස්තු අය නොකිරීම, බලපත්‍ර අලුත්කිරීමේදී අවලංගුව පැවති කාලසීමා තුළ කැණීම් කටයුතු සිදුකර ඇතිද යන්න පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් නොතිබීම, පාරිසරික නිර්දේශ, ප්‍රාදේශීය ලේකම් නිර්දේශ හා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා ලබා නොගැනීම. |
| (ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වාණිජ නොවන බලපත්‍ර නිකුත් කිරීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට බලපත්‍ර පොත් නිකුත් කිරීම, එම කාර්යාල නිකුත් කළ පොත් හා මාසික සාරාංශ ලබා ගැනීම, අනුපිටපත් සුරක්ෂිතව තබා ගැනීම යන කාර්යයන් ප්‍රමාණවත් අධීක්ෂණයක් යටතේ විධිමත්ව හා විශ්වාසදායී අයුරින් සිදුකර නොතිබීම. |
| (ඊ) කාර්ය මණ්ඩලය | කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම, බඳවා ගැනීම් පටිපාටි අනුමත කර ගැනීම හා පුරප්පාඩු පිරවීම කෙරෙහි අවධානය යොමු කර නොතිබීම. |